## රාජාංගනය ප්‍රාදේශීය සභාව
## අනුරාධපුර දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 04 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය.

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති රාජාංගනය ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩුපාඩු හා එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදුවී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | අඩුපාඩුවේ ස්වභාවය | විෂයයන් ගණන | මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම | | | |
|---|---|---|---|---|---|---|
| | | | ආදායම් | වියදම් | වගකීම් | වත්කම් |
| | | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 01 | - | - | 135 | - |
| | - එම - | 01 | - | 135 | - | - |
| | - එම - | 02 | 805 | - | - | - |

(ආ). මූල්‍ය ප්‍රකාශන

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වල අඩුවෙන් දැක්වීම් | 01 | - | - | 969 | - |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරීම් | 01 | - | - | - | 289 |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල අනුචිත හෙළිදරව් කිරීම් | 01 | 660 | - | - | - |
| | - එම - | 02 | - | 440 | - | - |

## 1.3.2 නොසැසඳු ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 13 කට අදාල ශේෂයන්ගේ එකතුව රු. 112,161,038 ක් වු අතර, උපයෝගි ලේඛන /වාර්තා අනුව එම ශේෂයන්ගේ එකතුව රු.33,907,390 ක් විය.

## 1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ප්‍රාදේශීය සභා සඳහා අනුමත ගිණුම් ක්‍රමය අනුව ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම සහ ස්ථාවර වත්කම් ගිණුම්වල ශේෂය සමාන විය යුතු වුවත් ශේෂපත්‍ර දිනට ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය රු.7,052,930 ක් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.14,109,226 ක් වුයෙන් එම ගිණුම් දෙක අතර රු.7,056,296 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ). ශේෂ පත්‍ර දිනට ලංකා බැංකුවේ සභාව නමින් ඇති ජංගම ගිණුමේ මුදල් පොත අනුව ශේෂය රු.59,686 ක් වුවද එය ශේෂ පත්‍රයේ රු.62,024 ක් ලෙස අනාවරණය කර තිබුන නමුත් ඊට හේතු පැහැදිලි නොකරන ලදී.

## 1.3.4 ව්‍යාජ වත්කම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම රු.538,663 ක් ලෙස අනාවරණය කර ඇති විෂයයන් 04 කට අයත් වත්කම් ව්‍යාජ වත්කම් ලෙස නිරීක්ෂණය විය.

## 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.17,152,336 ක්වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය /සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 1.3.6 අනුකූල නොවීම්

**නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) | |
| රීති 184 | සේවක ඇප ආයෝජනය කළ යුතු වුවත් රු.29,618 ක් වූ සේවක ඇප ආයෝජනය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මුදල් රෙගුලාසි 237 (අ) සහ (ආ) | රු.278,088 ක් වටිනා ගබඩා භාණ්ඩ, සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී ඒවා ගිවිසුම් ප්‍රකාරව ගුණාත්මකව ගබඩාවට ලැබුණු බවට හා තොග ලේඛනවලට ඇතුලත් කළ බවට සහතික නොවීය. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.380,762 ක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.577,005 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

සභාවේ මුදල් කටයුතු පවත්වා ගෙන යන ජංගම බැංකු ගිණුමෙහි බැංකු ප්‍රකාශනයට අනුව සමාලෝචිත වර්ෂය තුළදී පැවති සාමාන්‍ය මුදල් ශේෂය රු.1,678,300 ක් විය. මෙම මුදල් ශේෂයෙන් මාසික අවශ්‍යතාවය හදුනා ගෙන ඉතිරි මුදල් සභාවේ අරමුණු ඉටු කර ගැනීමට හෝ ඵලදායී ආයෝජනයක යෙදවීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (අ) | වරිපනම් හා බදු | - | - | - | 3 | - | 3 |
| (ආ) | බදු කුලී | 2,900 | 2,862 | 139 | 1,267 | 1,910 | 378 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 600 | 558 | 310 | 454 | 420 | 437 |
| (ඈ) | වෙනත් ආදායම් | 7,000 | 6,821 | 1,513 | 3,401 | 19,631 | 189 |

### 2.3.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥාපනතේ යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අය කර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.617,931 ක උසාවි දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.3.3 වරිපනම් බදු

----------------

සභා බල ප්‍රදේශයේ පිහිටි දියුණු කළ ප්‍රදේශ වශයෙන් නම් කර ඇති ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකම මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තියේ විධිවිධාන පරිදි වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.4 වෙනත් ආදායම්

1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීති අංක 59 හා රීති අංක 67 විධිවිධාන පරිදි 2010 වර්ෂය සඳහා බල ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත හා පොදු ව්‍යාපාර සහ වෘත්තීන් පිළිබඳව සමීක්ෂණයක් සිදු කර එම වාර්තා මත බදු මුදල් අය කර නොතිබුණි.

## 2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| පුනරාවර්තන වියදම් | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පෞද්ගලික | | | | | | |
| පඩිනඩි | 8,127 | 5,222 | 2,905 | 7,615 | 5,162 | 2,453 |
| අනෙකුත් | 3,387 | 4,638 | (1,251) | 3,381 | 4,005 | (624) |
| උප එකතුව | 11,514 | 9,860 | 1,654 | 10,996 | 9,167 | 1,829 |
| ප්‍රාග්ධන වියදම | 4,150 | 16,834 | (12,684) | 800 | 17,847 | (17,047) |
| මුළු එකතුව | 15,664 | 26,694 | (11,030) | 11,796 | 27,014 | (15,218) |

## 2.5 මානව සම්පත් කළමනාකරණය

### 2.5.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (i) | මාණ්ඩලික | 01 | 01 |
| (ii) | ද්විතීක | - | 02 |
| (iii) | ප්‍රාථමික | 10 | 07 |
| (iv) | වෙනත් (අනියම්,තාවකාලික) | -- | 11 |
| | එකතුව | 11 | 21 |

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන සභා අරමුදලින් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ අනුමත සීමාව ඉක්මවූ සේවකයින් 13 දෙනෙකු වෙනුවෙන් වැටුප් හා දිමනා ලෙස රු.1,129,880 ක් සභා අරමුදලින් දරා තිබුණි.

## 2.6 වත්කම් කළමනාකරණය

### 2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 52,292,568 ක් වු අතර, අවුරුදු 01 කාලයක් ඉක්මවා තිබුණු ගිණුම් ශේෂයන්හි එකතුව රු.1,904,931 ක් විය.

### 2.6.2 අය වීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව තිබුණු සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,213,195 ක් විය. සේවය අත්හැර ගිය සහ වර්තමානයේ විස්තර සොයාගත නොහැකි සේවකයින් 13 දෙනකුගෙන් අයවිය යුතුව තිබුණු රු.118,296 ක ණය ශේෂය ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.6.3 සමීක්ෂණය නොකළ වත්කම්**

**-------------------------------**

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු. 15,294,265 ක් විය.

**2.7 අවිධිමත් ගනුදෙනු**

**---------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 2.1 වගන්තිය ප්‍රකාරව විදේශ අධ්‍යයන වැඩ සටහන් සඳහා සමායෝජනය කළ යුත්තේ අමාත්‍යාංශ ලේකම් වරයා විසින් විය යුතු වුවත්, සභාපති වරයා සහභාගි වූ පුහුණු වැඩ සටහනක් සඳහා අමාත්‍යාංශ ලේකම් වරයාගේ අනුමැතියකින් තොරව රු.118,000 ක් ගෙවා තිබුණි.

**2.8 කාර්ය සාධනය**

**------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව, සුභසාධනයට අදාල කාර්යයන් හා සෞඛ්‍ය, මංමාවත් හා පොදු උපයෝගි සේවාවන්ට අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා ඉදිරි වර්ෂවල ක්‍රියාකාරීත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා එම සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.9 අභ්‍යන්තර විගණනය**

**-------------------------**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. පද්ධති හා පාලන.**

**-----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය.
(ආ) ආදායම් පරිපාලනය.
(ඇ) වත්කම් කළමනාකරණය.
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය.